මාධ්‍ය නිවේදන අංක 14

**මැතිවරණ කොමිෂන් සභාව**

**2021.05.04 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන නිවේදන නිකුත් කිරීමට තීරණ ගෙන ඇත.**

- මැතිවරණ නීති ප්‍රතිශෝධනය සඳහා වූ විශේෂ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කිරීම පිළිබඳව ව්‍යවස්ථාදායකය වෙත ගෞරවනීය ප්‍රසාදය පළ කර සිටින මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ කොමිෂන් සභාව වැඩ ආරම්භ කොට පසු දිනම අග්‍රාමාත්‍යතුමා හමු වී කරන ලද ඉල්ලීමට කඩිනමින් ප්‍රතිචාර දක්වමින්, දැඩි උනන්දුවකින් උපදෙස් දී ඒ පිළිබඳව ක්‍රියා කිරීම පිළිබඳව අග්‍රාමාත්‍යතුමා වෙත ද, ඒ සම්බන්ධව මැදිහත්ව ක්‍රියා කළ සභානායකතුමා හා විපක්ෂ නායකතුමා ඇතුළු මෙම යෝජනාව ඒකමතිකව සම්මත කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීවරුන් වෙත ද සිය ප්‍රණාමය ප්‍රකාශ කර සිටී.

- ප්‍රජාතන්ත්‍රීය ක්‍රමයක යහපැවැත්ම කෙරෙහි ව්‍යවස්ථාදායකයේ ක්‍රියාකාරීත්වය සහ මගපෙන්වීම ප්‍රබල සාධකයක් වන බව නිසැකය. දේශපාලනික, වෘත්තීයමය හා ගුණාත්මක ව්‍යවස්ථාදායකයක් පත් කර ගැනීමේ දී ඒ සඳහා මහජනතාවට ඇති අයිතිය හා බලය වඩා පිරිපුන්ව හා නිවැරදිව ප්‍රකාශ කිරීමේ පසුබිම හා අවස්ථාව සලසා ගත හැක්කේ මැතිවරණ ක්‍රියාවලිය සාධාරණ, විනිවිදභාවයෙන් යුතු දූෂණයෙන් හා අගතියෙන් තොර, සාධාරණ වූ අපේක්ෂකයනට සමබිමක් නිර්මාණය කරන හා රාජ්‍ය සම්පත් අයුතු භාවිතයෙන් බැහැර වූ හා අධිකතර වියදම්වලින් තොර වූ ක්‍රමවේදයක් මඟින් බව මැතිවරණ කොමිෂන් සභාව විශ්වාස කරයි. දැනට පවතින මැතිවරණ නීති එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රමාණවත් නොවන බවත්, නව නීති හා නව තාක්ෂණය ඇතුළත් කර ගැනීමේ අවශ්‍යතාව 1931 රාජ්‍ය මන්ත්‍රණ සභා කාලයේ සිට මේ දක්වා පැවති මැතිවරණ ක්‍රියාවලිය විසින් හා අධිකරණ තීරණ මඟින් පෙන්නුම් කර දී ඇත. නීති ප්‍රතිශෝධනයෙන් මෙම අවශ්‍යතාව සම්බන්ධව දේශපාලන පක්ෂ, මැතිවරණ විද්වත් සංවිධාන, සිවිල් සංවිධාන, නිරීක්ෂණ සංවිධාන, වෘත්තිය සමිති, ආගමික සංවිධාන හා ජනමාධ්‍ය මඟින් ද නිරන්තරව කරුණු ඉදිරිපත් කරනු ලැබ ඇත. මැතිවරණ ක්‍රියාවලියේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය වඩා පිවිතුරු හා ප්‍රජාතන්ත්‍රිකරණය කර ගැනීමට යෝජිත නීති ප්‍රතිසංස්කරණය මඟින් අපේක්ෂා කරනු ලබන අතර, ඵලදායී හා වඩාත් විශ්වසනීය ප්‍රජාතන්ත්‍රීය ව්‍යවස්ථාදායකයක් පත් කර ගැනීමට අදාළ යෝජනා, අදහස් මෙම පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසට සියලු දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, වෘත්තිය සමිති, වෘත්තීයවේදීන්, ආගමික සංවිධාන, ජනමාධ්‍ය සංවිධාන ඇතුළු මේ සම්බන්ධ උනන්දුවක් දක්වන සියලු පිරිස් වෙතින් මැතිවරණ කොමිෂන් සභාව ඉතා කාරුණිකව ඉල්ලා සිටී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.05.04